සැකසුම -U.G.I.P සුරවීර මිය,ර/රත්නපුර ධර්මපාල ම.වි.

**නිපුණතාවය :- 12:10 මෙහෙයවීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට අභිප්‍රේරණය ඉවහල්වන ආකාරය පෙන්වා දෙයි.**

ව්‍යාපාර සංවිධානයක මෙහෙයවීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා අභිප්‍රේරණ ක්‍රියාවලිය ඉතා වැදගත් වේ.

**ඒ අනුව යම් සංවිධානයක සේවා දායකයන්ගේ උපරිම දායකත්වය ස්ව කැමැත්තෙන්ම හා තෘප්තියෙන් ලබා ගැනීම සඳහා සේවය කිරීමට පෙළඹවීම අභිප්‍රේරණය ලෙස හැඳින්විය හැක.**

<u>මෙහෙයවීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට අභිප්‍රේරණය පහත පරිදි වැදගත්වේ.</u>

- සේවක ඵලදායිතාව ඉහළ දැමීමට.
- යහපත් කාර්මික සම්බන්ධතා වැඩිදියුණු කිරීමට.
- ව්‍යාපාරයේ කීර්තිනාමය ඉහළ යාම.
- සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට.
- ශ්‍රම පිරිවැය අඩුකර ගැනීමට.
- තෘප්තිමත් සේවක පිරිසක් බිහිකර ගැනීමට.
- සේවකයින්ගේ විශේෂ දක්ෂතාවලින් හා කුසලතාවලින් ප්‍රයෝජන ගැනීම.

මෙලෙස සේවකයින් පොළඹවා ගැනීමට ආයතන යොදාගන්නා අභිප්‍රේරණ ක්‍රම දෙයාකාරයකි,

**මූල්‍යමය අභිප්‍රේරණ ක්‍රම :-**

විවිධ වැටුප් ක්‍රම හඳුන්වා දීම / කොටස් හිමිකාරිත්වය ලබා දීම / ප්‍රසාද දීමනා ලබාදීම / ණය පහසුකම් ලබා දීම / ආයතනයේ නිශ්පාදන සහන මිලට ලබාදීම / නිශ්පාදන දිරි දීමනා ලබාදීම

**මූල්‍යමය නොවන අභිප්‍රේරණ ක්‍රම :-**

සේවක පුහුණුකිරීම් / උසස් වීම් ලබා දීම / රැකියා සුරක්ෂිතතාව ඇතිකිරීම / යෝග්‍ය වැඩ පරිසරයක් ඇතිකිරීම / නවීන උපකරණ සැපයීම / සෞඛ්‍ය පහසුකම් ලබාදීම / විනෝද චාරිකා සංවිධානය කිරීම / සේවකයන් ඇගයීම / සම්මාන පිරි නැමීම ආදී වශයෙන් හඳුනා ගත හැකිය.

පැවරුම :- ප්‍රදේශයේ ඇති ඔබ දන්නා ව්‍යපාර ආයතනයක් තෝරා ගන්න. එම ආයතනය සේවකයින් අභිප්‍රේරණය සඳහා යොදාගන්නා අභිප්‍රේරණ ක්‍රම පිළිබඳ තොරතුරු රැස් කරන්න. එම තොරතුරු ඇසුරෙන් මූල්‍යමය හා මූල්‍යමය නොවන අභිප්‍රේරණ ක්‍රම වෙන වෙනම හඳුනාගන්න.